සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## தென் மாகாணக் கல்வித் திணைக்களம்
## Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018 ජූලි 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜூலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
**General Certificate of Education (Adv. Level) Grade 12 Third Term Test 2018 July**

සිංහල I, II
Sinhala I, II

පිළිතුරු පත්‍රය I, II

71 S I, II

### I කොටස

(1) (අ) (i) ජීවක වෙදදුරු බුදුන්ට පිළියම් කිරීමට පැමිණි මහා පින්වතකු වීමත්, බුදුන්වහන්සේ දිව්‍යමය ප්‍රතිකාර ලැබිය යුතු නිසාත්.
(ii) ජීවකට වෛද්‍ය ශාස්ත්‍රය ඉගැන්වීමට.
(iii) ජීවකයන් උගත් ඖෂධවල නම් ආචාරීන් නොදන සිටීම.
(iv) කෘතාධිකාර පුණ්‍යවන්තයා - කරන ලද මහ පින් ඇති පින්වතා
අධිගෘහිත - අරක්ගත්

(ලකුණු 04යි)

(ආ) (i) රජතුමා උපදෙසකින් මහණ කරවීම සඳහා කැටුව යමි යි සිතා
(ii) කුමරු රජු කරා ගියවිට රජු ඔහු පැවිදිවීමට නොදී රඳවා ගනිති යි සිතා.
(iii) දිවි පමණකින් මුත් බොරු නොකීම.
(iv) තුන් පාය- මන්දිර තුන
සුවනස්නළුපිරිස් - ලක්ෂගණන් නාටක පිරිස්.

(ලකුණු 04යි)

(ඉ) (i) බරණැස් රජු ලිය කිඳුරාට විඳි හී පහර නිසා දුකින් වැලපෙන කිඳුරිය දැක.
(ii) මහ බෝසතානන් වැතිර සිටි ගල මුදුනට පැමිණි කෙණ්ඩිකාවෙන් පැන් ඉසීම.
(iii) තම සැමියා සුවපත් කළ නිසා
(iv) අනිත් අයගේ සිත් තැවුල් ඇති කිරීමට මළ අයෙකු සේ වැටී සිටින්නකු මෙන්.

(ලකුණු 04යි)

(ඊ) (i) බ්‍රහ්මදත්ත රජු
(ii) රූපකාලංකාරය
(iii) ලැව් ගින්නක් සේ
(iv) ඔහුගේ කීර්තිය නම් වූ වැල ද ලියලා ගියේය.

(ලකුණු 04යි)

(උ) (i) සද්ධර්මරත්නාවලියේ මට්ටකුණ්ඩලී වස්තුවෙහි සඳහන් මට්ටකුණ්ඩලී කුමාරයාට පාණ්ඩු රෝගය සැදුණු පසු ඔහුගේ මව විසින් අදින්නපුබ්බක බමුණාට.
(ii) පූජාවලියෙහි අනුරුද්ධ කුමාර කථා වස්තුවෙහි අනුරුද්ධ කුමරු විසින් උපයා කෑම දුක් සහිත බව මහානාම කුමරුට දන්වන අවස්ථාව.
(iii) වහල්ලු කෙටිකතාවේ උපාලිස්ගේ දියණිය හඳයාට පුනක්කු දමූ අවස්ථාවේ හඳයාට කියන ලද්දකි.
(iv) ස්නේහය කෙටිකතාවේ සඳහන් පිංචි මහයියා විසින් තම සැමියා වූ රංකිරා උන්දැට, පුතා එවූ ලියුමක් පැදුරු ආනේ ඇතැයි ඔහු අවුස්සා බලන විට.
(v) නොනිමි සිත්තම කෙටිකතාවේ සඳහන් ශීලා, අසංග කාර්යාලයට ඇතුළු වන විට අසංකගේ බිරිඳ වූ මාලනී පිළිබඳ කළ සඳහනකි.
(vi) දිසෙන්චිනාහාමි කෙටිකතාවේ සඳහන් බන්දු විසින් දොස්තර ජයවර්ධනට දිසෙන්චිනාහාමි කියූ කතාවක් පිළිබඳ විමසූ විට.

(ලකුණු 16යි)

### II කොටස

(1) ප්‍රශ්නය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1.1 | (5) | 1.6 | (3) | 1.11 | (3) | 1.16 | (4) |
| 1.2 | (3) | 1.7 | (5) | 1.12 | (5) | 1.17 | (3) |
| 1.3 | (2) | 1.8 | (2) | 1.13 | (1) | 1.18 | (5) |
| 1.4 | (4) | 1.9 | (1) | 1.14 | (1) | 1.19 | (2) |
| 1.5 | (1) | 1.10 | (4) | 1.15 | (2) | 1.20 | (1) |

(ලකුණු 20යි)

(2) (අ) (i) දෙකකි
1. සිංහලය සකු මගධ බස්වලින් පහළ වූවක් බව
2. ඒ භාෂාවට සමාන්තරව ස්වාධීනව වර්ධනය වූ බව
(ii) හෙළ බසේ ලකුණු මැනවින් ආරක්ෂිතව පැවතියේ ගද්‍යයෙහි නොව පද්‍යයෙහි වීම නිසා ය.
(iii) කුමාරතුංග (මුනිදාස) විසි වැනි සියවසේදී සිංහලය සංස්කෘත ආධිපත්‍යයෙන් මුදා ගැනීමට ගත් උත්සාහය

(iv) (එක් සාධකයක් දැක්වීම ප්‍රමාණවත්)

1. සිදත්කරු සිංහල හෝඩිය ලෙස සංස්කෘත හෝඩිය නොදැක්වීම.
2. සිදත්කරු ගද්‍ය ව්‍යවහාරය නොගැනීම හා පද්‍ය ව්‍යවහාරය පමණක් ගැනීම.
3. සිංහල ස්වාධීන ලක්ෂණ ඇති බසක් ලෙස සිදත්කරු සැලකීම.

(v) දහතුන්වැනි සියවස , පද්‍ය ව්‍යවහාරය/කාව්‍ය ව්‍යවහාරය (ලකුණු 10යි)

(ආ) සාරාංශය

සන්නිවේදනයට සංසටක තුනක් අයත් බව
මනසෙහි තිබෙන අදහස ග්‍රාහකයාට අවබෝධ වන අයුරු ප්‍රකාශ කිරීම සංකේතිකරණයයි
සන්නිවේදනයට කිසියම් මාධ්‍යයක් අත්‍යවශ්‍ය බව.
වාසි අවාසි මත අවස්ථෝචිතව මාධ්‍ය තෝරා ගැනීම
සම්මුඛ කථාවෙහි ප්‍රතිපෝෂණය ක්ෂණික ව ලද හැකි වුවත් බොහෝ දෙනෙක් ඇමතිය නො හැක.
මෙම අවාසිය ගුවන් විදුලිය හා රූපවාහිනිය මාධ්‍ය මඟ හරවා ගනී.

(ලකුණු 15යි)

3. ප්‍රශ්නය

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

(i) රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය
(ii) එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
(iii) කරුණුවල පැහැදිලි බව
(iv) නිවැරදි අක්ෂර වින්‍යාසය
(v) ව්‍යාකරණ දෝෂ රහිත වීම.
(vi) භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම.
(vii) සුදුසු ලෙස ඡේද වෙන් කිරීම.
(viii) කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලි වීම.
(ix) විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (උපමා, රූපක, ආප්තෝපදේශය, ප්‍රස්තාව පිරුළු)

(ලකුණු 25යි)

4. (අ)

(i) සාහිත්‍යකරුවෝ විසිපස් දෙනෙක් සම්මන්ත්‍රණයට සහභාගි වූහ.
(ii) ගොවියන් ද සමග ඇමතිතුමා වැව් අමුණු පරික්ෂා කරයි.
(iii) දක්ෂ කිවිදියක වූ රංජනී ප්‍රවීණ ගායිකාවක් ද වූවා ය.
(iv) බුද්ධිමත් ගුරුවරියක් සාහිත්‍ය නිර්මාණය කෙරෙහි අප යොමු කළා ය.
(v) වැඩිහිටියෝ පොත්පත් කියවත් නම් දරුවෝ ද පොත්පත් කියවති.

(ලකුණු 05යි)

(ආ)

(i) වෛද්‍යවරයා විසින් රෝග නිශ්චය කරනු වස් රෝගියාගෙන් ප්‍රශ්න ඇසිණ/ඇසිණි/අසනු ලැබුවේ ය/අසනු ලැබීය.
(ii) ඇතැම් විද්වතුන් විසින් උඩරට නර්තන සම්ප්‍රදාය උසස් ලෙසින් සැලකෙයි/සලකනු ලැබේ/සලකනු ලබයි.
(iii) පරිසරවේදීන් විසින් පරිසර හිතකාමීන් ලවා මහ මග දෙපස පැළ රෝපණය කෙරේ/කරවනු ලැබේ/කරවනු ලබයි.
(iv) විදුහල්පතිතුමා විසින් නවක ගුරුවරියක් ආචාර්ය මණ්ඩලයට හඳුන්වා දෙන ලද්දීය ය/දෙනු ලැබුවා ය.
(v) ජනාධිපතිතුමා විසින් නවක ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සාදරයෙන් පිළිගන්නා ලදහ/ලද්දෝය/ පිළිගනු ලැබූහ.

(ලකුණු 05යි)

(ඉ)

(i) අයෙක් (නටති/නටයි) බමන මතින්
(ii) (නැණවත්තු/නැණවතුන්) අදහස් ප්‍රකාශ කළහොත් ඒවාට මැනවින් කන් දිය යුතු ය.
(iii) ප්‍රවීණ (ගායකයෙකු/ගායකයෙක්) වන්නේ කෙසේද?
(iv) පෙරහැරට රැගෙන ආ ඇත් රංචුව දිය නෑමට ගඟට (බසියි/බසිති)
(v) අප කරා පැමිණි (දරුවෝ/දරුවන්) දූත් රට පුරා විසිරි රැකියාවල යෙදෙති.

(ලකුණු 05යි)

5. (අ)

(i) සංස්කෘතික සංස්පර්ශය - සංස්කෘතීන් එකිනෙකට ගැටීම.
(ii) භාෂා විමර්ශනය - භාෂා සෝදිසි කිරීම / භාෂාව පිළිබඳ ව විමසීම
(iii) චිරස්ථිතිය - දීර්ඝ කාලීන පැවැත්ම (ලකුණු 03යි)

(ආ)

(i) රිදියෙන් කරන ලද - රජතමය / රිදීමුවා
(ii) කළගුණ නොසලකන - අකෘතඥ
(iii) වනයට අධිපති - වනස්පති (ලකුණු 03යි)

(ඉ)

(i) ප්‍රත්‍යක්ෂ (ii) යාවජීව
(iii) වගවිය (iv) ආචාරශීලීභාවය
(v) ප්‍රසාරණය (vi) අනල්ප (ලකුණු 03යි)

(ඊ)

(i) පෙළ පේළිය/බුද්ධ වචනය/පන්තිය/සමූහය/පෙළපත
(ii) දද මෝඩ/කොඩිය/පක්ෂියා/කුණ්ඨය/බමුණා
(iii) හඳ සුන්දර/යහපත්/සුබ කාලය/වාසනාවන්ත
(iv) මල පුඩුව/පුෂ්පය/මලකඩ/ඉඳිකටු සිදුර/අසූචි
(v) වග තොරතුරු/සමූහය/පෙළ/රංචුව/වර්ගය/ග්‍රන්ථාංශය/ දෝෂාරෝපණය
(vi) කැන් සමූහය/මිටිය/කාන්තිය/කඳ/පොකුර/කැඳ

(ලකුණු 06යි)

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | අංගය | අනු අංගය | (ii) | අංගය | අනු අංගය |
| මලසුන | සන්ධි | ස්වර සන්ධිය | කර්මානුරූප | සන්ධි | ස්වර දීර්ඝය |
| මත | නිපාත | විභක්ත්‍යර්ථ හඟවන | අභිරූප | සමාස | අව්‍ය සමාසය |
| සුවඳ | සමාස | අව්‍ය සමාසය | සෞන්දර්යයෙන් | ප්‍රත්‍යාර්ථ නාම | තද්ධිත |
| (iii) | අංගය | අනු අංගය | (iv) | අංගය | අනු අංගය |
| මගෙ පුතා | විභක්ති | සම්බන්ධ විභක්ති | මිහිඳු හිමි | සමාස | විශේෂ සමාස |
| එන්නැ | ක්‍රියා | විධි ක්‍රියා | පෝදා | විභක්ති | ආධාර විභක්ති |
| රෝස මලේ | සමාස | විශේෂණ සමාස | මිහින්තලය | සන්ධි | ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය |
| (v) | අංගය | අනු අංගය | | | |
| නිලධාරීහු | විභක්ති | ප්‍රථමා විභක්ති | | | |
| වනාන්තරයේ | විභක්ති | ආධාර විභක්ති | | | |
| අලි පැටියෙකු | විභක්ති | කර්ම විභක්ති | | | |

(ලකුණු 15යි)

(i) අගේ ඉඳන් කන කැම
(ii) ඔරුවට වඩා කොල්ලෑව ලොකු වීම
(iii) ලූලා නැති වළට කණයා පණ්ඩිකයා
(iv) වත්ත බද්ධට දී ඇස්සට දත නියවීම
(v) එළිපත්ත උඩ ඉන්න බළලා වගෙයි
(vi) කොට්ටෝරුවා කෙසෙල් ගසට කෙටීම (ලකුණු 03යි)

(ආ)
(i) එකම අත්දැකීම් ඇති අය
(ii) අනවශ්‍ය කරදරයක්
(iii) ව්‍යාජ ශෝකය
(iv) වැරදි වසං කිරීම
(v) අපහාස කිරීම
(vi) නිෂ්ඵල වූ කෙළවරක් නැති කථා (ලකුණු 03යි)

නියමිත වචනය ලියා ඇති විට අදහස ප්‍රකට වේ නම් ලකුණු දෙන්න.

(ඉ)
(i) අර්ථයෙන් සමාන පද
(ii) පද දෙක සමාන නොවුව ද කිසියම් සම්බන්ධයක් ඇත.
(iii) එක් එක් අර්ථයක් ඇති නමුත් අනෙක් පදයෙහි අර්ථයක් නැත.
(iv) පද දෙකෙහි ම අර්ථයක් නැත.
(v) විරුද්ධ පද දෙකක් එකට යෙදීම.
(vi) මුල් පදයේ අර්ථය දෙවෙනි පදයෙන් තීව්‍ර කිරීම.

(ලකුණු 03යි)

(ඊ)
(i) කොස්ස
(ii) ගස්වලින් ගහණ පෙදෙස
(iii) වහිනවා
(iv) ලොකු අම්මා
(v) පොල් කටුව (ලකුණු 03යි)

(vi) හිරු

(උ) (i) ගොයමෙහි ළා බාල අවස්ථාව
(ii) වෙරළෙහි මාළු විකුණන ස්ථානය
(iii) හිමිදිරිය
(iv) ජෝඩු කිරීම
(v) ගොබය (ලකුණු 03යි)
(vi) හාල් ගරන බඳුන

8\. (i) ආර්ථික වර්ධන වේගය තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය මානව ප්‍රාග්ධන පදනම බිහි කිරීමෙහි ලා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය සැලකිය යුතු ලෙස නවීකරණයට ලක්විය යුතු බව පැහැදිලි ව හඳුනාගෙන ඇත. අධ්‍යාපනයේ නිසි ප්‍රතිලාභ ලැබෙනුයේ, අධ්‍යාපන සේවා ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතාවයන්ට ගැළපුණහොත් පමණි. එම නිසා, අධ්‍යාපන ක්‍රමය විභාගය මූලික කරගත් විෂය කරුණු මත පදනම් වූ විෂය මාලාවලින් පරිබාහිර ව ශිෂ්‍යයන්ට ජීවිතයට අවශ්‍ය කුසලතා සහ ස්වාධීන ව සිතීමේ හැකියාව ලබා දෙන ආකාරයෙන් නිපුණතා මත පදනම් වූ විෂය මාලාවක් බවට වෙනස් කළ යුතු ව තිබේ. විශ්ව විද්‍යාල පද්ධතිය තුළ සිදු කරන ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සහ උපාධිධාරීන්ගේ කුසලතා අතර පවතින නොගැළපීම අඩු කළ යුතු අතර, එය තරුණ කොටස් අතර සේවා වියුක්තිය හා ඌන සේවා නියුක්තිය අඩු කිරීමට හේතු වනු ඇත.

පද බෙදීම (ලකුණ 03)
විරාම ලක්ෂණ (ලකුණු 04)

(ii) ශ්‍රී / ශ්‍රම / අවශ්‍යතාවයන්ට / විෂය / ශිෂ්‍යයන්ට / විශ්ව විද්‍යාලය
(iii) කුසලතා
(iv) ගැළපුණහොත් යන්නෙහි පිල්ලම් නම් කරන්න. ඇදපිල්ල, පාපිල්ල, කොම්බුව හා ඇලපිල්ල
(v) නිවැරදි පිළිතුරට ලකුණු දෙන්න.

(ලකුණු 08යි)